# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2109/25 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන්කෝරළේ පල්ලෙ පත්තුවේ, ගඟුල්විටිය ග්‍රාමනිලධාරි වසමේ (183 සී), ගඟුල්විටිය ගම පිහිටි හෙක්ටයාර 9.1057 ක් වූ රඹුක්කන්දවත්ත, ගඟුල්විටියවත්ත, දවටගහදෙනිය හේන නැමැති ඉඩම.

01. කැබලි අංක 108

උතුරඃ කැබලි අංක 19, මාර්ගය (ප්‍රාදේශීය සභාව), කැබලි අංක 73 සහ 18; නැගෙනහිරඃ කැබලි අංක 19 සහ ගඟුල්විටිය දොළ; දකුණඃ කැබලි අංක 19 සහ ගඟුල්විටිය දොළ; බටහිරඃ කැබලි අංක 19 සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); ප්‍රමාණයඃ හෙක්ටයාර් 6.6163.

02. කැබලි අංක 109

උතුරඃ දොළ, මාර්ගය (ප්‍රාදේශීය සභාව), කැබලි අංක 56 සහ 74; නැගෙනහිරඃ මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ කැබලි අංක 56; දකුණඃ මාර්ගය (ප්‍රාදේශීය සභාව) කැබලි අංක 50; බටහිරඃ කැබලි අංක 50 සහ දොළ; ප්‍රමාණයඃ හෙක්ටයාර් 2.4894.

හිමිකම් කියන්නා : රජය (ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කරගෙන ඇත. මුල් හිමිකම් කියන්නා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව)

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 මැයි මස 02 වැනි දින පෙ.ව. 10.30 ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 අප්‍රේල් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2019 ජනවාරි මස 31 වැනි දින,

02-824


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.



1A - G 29421 - 17 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.